# පාර්ලිමේන්තුව හා වික්ටෝරියානු කුහකත්වය

එංගලන්තය පාර්ලිමේන්තුවක් පිහිටු වූ පළමු රට විය. එහෙත් ඔවුන්ට පාර්ලිමේන්තුව පිහිටුවාගැනීමට හැකිවූයේ අවුරුදු සියගණනක් තිස්සේ කෙරීගෙන ගිය අරගලයක ප්‍රතිඵලයක් ලෙස බව අපි කලින් සඳහන් කෙළෙමු. තවමත් ඒ සම්පූර්ණ වී නැත. බ්‍රිතානි පාර්ලිමේන්තුව යැයි අද හැඳින්වෙන මේ එංගලන්ත පාර්ලිමේන්තුව ම දළ වශයෙන් වික්ටෝරියානු කුහකත්වය යැයි කියැවෙන්නට හොඳ ම උදාහරණය වෙයි. බ්‍රිතානි පාර්ලිමේන්තුවෙහි කොටස් දෙකක් වෙයි. එකක් මහජන මන්ත්‍රී මණ්ඩලය ය. එය පොදු ජනයාගේ සභාව (House of Commons) නමින් හඳුන්වනු ලැබෙයි. එයට අමතරව සාමි මන්ත්‍රී මණ්ඩලය වෙයි. ඒ පාරම්පරික රදළයන්ගේ ද පූජකයන්ගේ ද අළුතින් පත්කෙරෙන රදළයන්ගේ ද සභාව වෙයි. මෙයට අමතරව රැජින වෙයි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි එංගලන්තය හැරුණු කොට ප්‍රධාන රට වූ ප්‍රංශයෙහි රජවරුනට හිමිවූයේ ගිලටීනය නම් දංගෙඩිය ය. එහි දී රජවරු මැරුම්කෑහ. රටේ පාලන බලය ජනාධිපතිවරයකුට හා පාර්ලිමේන්තුවට හිමිවිය. ප්‍රංශයට කතෝලික චින්තයෙහි වූ රාජාණ්ඩුව මුළුමනින් ම නැතිකර බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආයතනය වූ ජනරජයක් (republic) හෙවත් ජනයාගේ රාජ්‍යයක් ඇතිකර ගැනීමට හැකි විය. එහෙත් එංගලන්තයට ඒ ආයතනය එලෙසින් ඇතිකර ගැනීමට නො හැකි විය. පසු කලෙක එංගලන්තයෙන් අයර්ලන්තයෙන් හා අනෙක් රටවලින් ගොස් ඇමරිකානු එක්සත් ජනපද නමින් රාජ්‍යයක් බිහිකළ අය ද රජුන් නැති ජනරජයක් ම තෝරාගත් හ.

එහෙත් එංගලන්තයේ රජවරු නැති නොවුණහ. රජවරුන්ගේ දේශපාලන බලය අඩු වී ඇති නමුත් ඔවුන්ට තවමත් විශේෂ අවස්ථාවල බල තල ඇත. එමෙන් ම රජවරුන්ගේ ආර්ථිකය ද ඉතාමත් ශක්තිමත් වෙයි. කෙටියෙන් කිවහොත් එංගලන්තයට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආයතනය වූ ජනරජයක් ඇතිකර ගැනීමට නොහැකි විය. ලෝකයේ අන්තිමට ඉතිරිවන්නේ කඩදාසි කුට්ටමේ රජවරු හතරදෙනා හා එංගලන්තයේ රජු යැයි යමකු පවසා ඇත්තේ විහිළුවට ම නො වෙයි.

සාහිත්‍යය ගැන කතාකිරීමට ගොස් දේශපාලනය ගැන සඳහන් කරන්නේ ඇයි ද යන්න යමකුට ප්‍රශ්නයක් විය හැකි ය. (මේ ලිපි මුල සිට ම කියවන්නකුට නම් එවැනි විචිකිච්ඡාවක් ඇතිවිය හැකි නො වෙයි.) එහෙත් මේ සෑම කරුණක් ම එකිනෙකට බැඳී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් ඒ වෙන්කර ඉදිරිපත්කෙරෙන අතරෙහි දී ම වීම එක්තරා ආකාරයක සරදමකි. එංගලන්තයේ පාර්ලිමේන්තුව ඒ ආකාරයෙන් පැවැත්මත්, එංගලන්තයට ජනරජයක් බිහිකර ගැනීමට නොහැකිවීමත්, වික්ටෝරියානු කුහකත්වයත්, එංගලන්තයේ කර්මාන්ත ශ්‍රේණි ක්‍රමයට සකස්වීමත් අතර ඇත්තේ සම්බන්ධයකි.

එංගලන්තයට ජනරජයක් ඇතිකර ගැනීමට නොහැකිවීම, වික්ටෝරියානු කුහකත්වය ඇතුළු අනෙක් දෑට ද බල පෑ එක් වැදගත් කරුණක් වූයේ එරට ඉතා ඉක්මණින් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අදාළ තත්වයන්ට පත්වීම ය. ඒ එක්තරා ආකාරයකින් ගත්කල කුරුළු වීමක් විය. වෙනත් වචනවලින් කියන්නේ නම් නියමිත කලට පෙර බිහිවීමක් විය. බටහිර රාජාණ්ඩු ක්‍රමයෙන් කැඩී ජනරජ ඇතිකර ගැනීමට සුදුසු කාලයක් විය. එයට කලින් ඒ ආයතනය බිහිකිරීමට උත්සාහ ගැනීම මගින් සිදු වූයේ ආයතනය නියමිත ආකාරයට බිහි නො වීම ය. එංගලන්තයේ අදාළ ආයතන බිහිවීම ඇරඹුණේ බටහිර යුරෝපයේ එවැනි ආයතන බිහිවීමට සුදුසු කාලයට සියවස් දෙක තුනකට පෙර ය.

එංගලන්තයේ පාර්ලිමේන්තුව යනු රාජාණ්ඩුව හා ජනරජය අතර වූ ආණ්ඩු ක්‍රමයක වූ ආයතනයකි. පොදු ජන සභාව, සාමි මන්ත්‍රණ මණ්ඩලය, රජු යන ත්‍රිත්වයෙන් පෙන්නුම් කෙරෙන්නේ එරටට ඒ ආයතන නිසි ආකාරයෙන් වර්ධනය කරගැනීමට නො හැකිවීම ය. දේශපාලනයේ දී මෙන් ම සංස්කෘතියේ දී ද , සාහිත්‍යයේ ද ඒ එසේ ම විය. එපමණක් නොව අධිකරණයේ පවා ඒ දැකගත හැකිවිය. එංගලන්තයේ උසස් ම අධිකරණය වනුයේ සාමි මන්ත්‍රී මණ්ඩල විනිශ්චය සභාව හෙවත් ප්‍රිවි කවුන්සිලය (Privy Council) ය. ඉහළම අධිකරණය එසේ මන්ත්‍රී මණ්ඩලය

© Prof. Nalin De Silva

තුළ ම වීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පටහැණි ය. එහෙත් වෙනත් ස්වාධීන ආයතනයක් ගොඩනගා ගැනීමට තරම් අත්දැකීමක් ඔවුනට බටහිර යුරෝපයේ වෙනත් රටකින් හෝ ලබාගත නොහැකි විය.
එහෙත් ප්‍රංශ විප්ලවයට එවැනි බාග හෝ අත්දැකීම් ලැබූ රටවල ආදර්ශය විය. එංගලන්තය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අඩ වශයෙන් අවතීර්ණ වුව ද ප්‍රංශයට එසේ වීමට තරම් කරුණු නො වී ය. බටහිර ක්‍රිස්තියානු නූතනත්වයට අවශ්‍ය අන්දමින් දේශපාලන ආයතන ගොඩනගා ගැනීමට එංගලන්තයට නොහැකි වූ පරිදි ම, එරටට ඒ සංස්කෘතියෙහි සංස්කෘතික මතිමතාන්තර ගොඩනගා ගැනීමට නො හැකි විය. ඩී. එච්. ලෝරන්ස් මහතා වැන්නන් සාහිත්‍යයෙහි දී ඉදිරිපත් වූයේ ඒ කාර්යය, එනම් අදාළ සංස්කෘතික මතිමතාන්තර ගොඩනගා ගැනීමට ය.

ලෝරන්ස් මහතාට අවශ්‍යවූයේ, එසේත් නැතහොත් ඒ මහතා ඇතුළු වෙනත් එවැන්නන්ගෙන් සමාජය බලාපොරොත්තුවූයේ වික්ටෝරියානු සමාජයට ගොඩනගාගත නොහැකිව තිබූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය සදාචාර සංග්‍රහය (moral code) ගොඩනගා ගැනීම ය. එතෙක් සමාජයේ සම්මුතිය වී තිබුණේ කතෝලික සදාචාර සංග්‍රහයකි. එහෙත් ඒ වන විට ද ඇතැම් පුද්ගලයන් ප්‍රසිද්ධියේත් අප්‍රසිද්ධියේත් කතෝලික සදාචාර සංග්‍රහයට පිටින් කටයුතු කරනු දක්නට තිබුණි. විශේෂයෙන් ම විවාහය හා ලිංගිකත්වය පිළිබඳ කරුණුවල දී ඒ එසේ විය. සමාජය ප්‍රසිද්ධියේ පිළිගත්තේ වැඩවසම් කතෝලික සමාජයෙන් ලැබුණු සදාචාරය ය. එහෙත් අප්‍රසිද්ධියේ තැන තැන කතෝලික සදාචාරයට පිටින් පුද්ගලයෝ කටයුතු කළහ.

එහෙත් මේ පිළිවෙත වෙනස්කර නව චින්තනයට, එනම් පහළොස්වැනි සියවසේ පමණ සිට යුරෝපයේ කරළියට පැමිණි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට, අනුකූල වූ සදාචාරයක් ප්‍රසිද්ධියේ පවත්වාගෙන යෑමට සමාජයට අවශ්‍ය විය. ලෝරන්ස් මහතාගේ නවකතාවලින් සිදුවූයේ මිනිසුන්ගේ (පිරිමින්ගේ හා ගැහැණුන්ගේ) ලිංගිකත්වය පිළිබඳ කරුණු ප්‍රසිද්ධියේ කතාකිරීමත් එමඟින් නව සදාචාරයක් ගොඩනගා ගැනීමට කටයුතු කිරීමත් ය. කතෝලික සංස්කෘතියෙහි ලිංගිකත්වය බැඳ තිබූ බැමි සමහරක් කඩා දැමීම මේ ව්‍යාපෘතියෙහි අරමුණ විය.

සදාචාරය යන්න ද අනෙක් දෑ මෙන් ම සාපේක්ෂ වෙයි. සදාචාරය හෙවත් යහපත් හැසිරීම යන්න තීරණය කරන්නේ දෙවියන් වහන්සේ හෝ වෙනත් අයකු හෝ විසින් නොව සමාජය විසින් ය. ඒ ඒ සමාජය ඒ ඒ සමාජයට අවශ්‍ය සදාචාරය කුමක් දැයි තීරණය කරයි. එහෙත් බටහිර කතෝලික සමාජයෙහි මෙන් ම භාරතීය වෛදික සමාජයෙහි ද සදාචාර සංග්‍රහය දෙවියන් වහන්සේගේ ම (බ්‍රහ්මන්ගේ - අඩුම තරමින් මනුගේ) නිර්මාණයක් ලෙස හඳුන්වා දී තිබුණි. මේ සදාචාර සංග්‍රහය කැඩීම බලවත් වරදක් විය.

එහෙත් වැඩිදුර යෑමට පෙර කිවයුතු කරුණක් වෙයි. පැරණි සමාජවල තහවුරු කෙරුණු මතය කුමක් වුවත් ඒ ඒ සමාජයේ සදාචාර සංග්‍රහය ගොඩනැගුණේ සමස්තයක් ලෙස ගත්කල ඒ ඒ සමාජයට අවශ්‍ය අන්දමට ය. වෙනත් රටවලින් ජනතාව පැමිණ ඒ ඒ රටවල පදිංචි වූ අවස්ථාවල ඔවුන් තම තමන්ගේ සදාචාර සංග්‍රහ නොගෙනාවා නො වෙයි. එහෙත් එලෙස ගෙන ආ සදාචාර සංග්‍රහ හා එවකටත් තිබූ සදාචාර සංග්‍රහ මිශ්‍ර වීමෙන් (හෝ කිරීමෙන්) නව සදාචාර සංග්‍රහ තනාගැනීමට ඒ සමාජවලට හැකි විය. ඒ සදාචාර සංග්‍රහ නිර්මාණයේ දී සංස්කෘතික යටත්විජිතවාදයක් ක්‍රියාත්මක වී නම් ඒ සුළු වශයෙනි.

එහෙත් අද තත්වය එසේ නො වෙයි. පහළොස්වැනි සියවසේ පමණ කරළියට පැමිණ අද ආධිපත්‍යයට පත්වී ඇති ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා අදාළ සදාචාර සංග්‍රහය ලෝකයට ම බලයෙන් පටවනු දැකිය හැකි ය. අපේ සමාජයට අවශ්‍ය වුවත් නැතත් අද අපට බටහිරයන්ගේ සදාචාරය අපේ ද සදාචාරය බවට පත්කර ගැනීමට බල කෙරෙයි. ඒ බලකිරීමට විරුද්ධවීම ප්‍රතිගාමී කටයුත්තක් නැතහොත් බොරු සුචරිතවාදයක්, එසේත් නැතහොත් වික්ටෝරියානු කුහකත්වයක් ආදී වශයෙන් හඳුන්වා තමන් හරිහැටි නොදන්නා සංකල්පවලින් ඒ විරුද්ධවන්නන්ට දමා ගැසීමේ ප්‍රවනතවක් අද දකින්නට ඇත. වික්ටෝරියානු කුහකත්වය යන්න ගැන මෙලෝ හසරක් නොදැන ඒ ආයුධයක් ලෙස යොදාගනිමින් ඉන් දමා ගසන්නෝ කොතෙක් වෙත් ද?

මේ පඬියන්ගේ දැනගැනීම සඳහා කිවයුතු කරුණක් වෙයි. පඬියන් දන්නේ අතනින් මෙතනින් වචන ගෙන දමා ගැසීම ය. ඔවුන් කිසිදාක සංකල්පයක විකාශය හදාරා ඇතැයි සිතිය නො හැකි ය. සුචරිතවාදියා (puritan) යන්නෙන්

© Prof. Nalin De Silva

බටහිර යොදාගැනෙන සංකල්පයට ද ඉතිහාසයක් ඇත. පියුරිටන් යන වචනයේ සම්භවය අයත්වන්නේ එංගලන්තයට ය. පියුරිටන්වාදියා සුචරිතවාදියා ආදී වචනවලින් අද සාමාන්‍යයෙන් අදහස් කෙරෙන්නේ සමාජයේ වර්ධනයට, ඉදිරි ගමනට බාධාවක් ව ආපස්සට යන තැනැත්තෙකි. එහෙත් කලකට පෙර ඒ එසේ නො වී ය.

එංගලන්තයේ  පළමුවන එලිසබෙත් රැජිනගේ කාලය වන විට ද ප්‍රොතෙස්තන්ත ආගම නිසි ලෙස වර්ධනය වී පිළිගැනී නොමැති යැයි සිතූ ප්‍රොතෙස්තන්තවාදීහු සිටියහ. එංගලන්තයේ ඇති වූ කතෝලික නොවන ආගම ද එකල හැඳින්වූ ආකාරයට ප්‍රොතෙස්තන්තවාදයක් විය. ඒ ඇංග්ලිකන් ක්‍රිස්තියානිය බවට පත්වූයේ කාලයත් සමග ය. ප්‍රොතෙස්තන්තවාදීන්ට එදා අවශ්‍ය වූයේ ප්‍රෙතෙස්තන්ත ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කිරීම ය. අද පවා උතුරු අයර්ලන්තයේ ප්‍රශ්නය ඇත්තේ කතෝලිකයන් හා ප්‍රෙතෙස්තන්ත වාදීන් අතර ය. උතුරු අයර්ලන්ත ප්‍රශ්නය විසඳා ඇතැයි එංගලන්ත ආණ්ඩුව කියන බව ද මෙහි දී සඳහන් කළ යුතු ය.

ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ අසම්පූර්ණ යැයි සැලකූ පිරිසට අවශ්‍ය වූයේ ඒ ප්‍රතිසංස්කරණ තවත් ඉදිරියට  ගෙන යෑම ය. ඔවුන්ට අවශ්‍ය වූයේ කතෝලික ආගමෙන් බැහැර වූ සුපිරිසිදු ප්‍රෙතෙස්තන්ත ආගමකි. ඔවුහු කිසි දිනෙක තමන් සමාජය ආපස්සට ගෙන යන්නන් ලෙස නො සිතූ හ. ඔවුන්ට අනුව ඔවුහු සමාජය ඉදිරියට ගෙන ගියහ. එහෙත් එංගලන්තයේ සමාජ විකාශයේ ස්වභාවය අනුව ම වික්ටෝරියා සමය වන විට පියුරිටන් යන වචනයේ අර්ථය වෙනස් වී තිබුණි. පියුරිටන් යන්නෙන් ඒ වන විට හඳුන්වනු ලැබුයේ එවක සමාජයේ සදාචාර සංග්‍රහය වෙනස්කිරීමට විරුද්ධ අය ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva